**ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන්**
**ආරක්ෂාකාරී රිය ධාවනය පිළිබඳ**
**ACI (Automobile Club d'Italia) පාඨමාලාව**

ඉතාලියේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, **ACI** (Automobile Club d'Italia) සමග සහයෝගී සම්බන්ධතාවයෙන් මෙරට ජීවත්වන ඉතාලි රියදුරු බලපත් ලාභී ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් උසස් පිළිගැනීමක් ඇති **ආරක්ෂාකාරී රිය ධාවන** පාඨමාලාවක් පැවැත්වීමට සියලු කටයුතු සම්පාදනය කර ඇත. මෙම පාඨමාලාව සීමිත පදනමක් යටතේ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් නොමිලේ පැවැත්වීමට තානාපති කාර්යාලය සහ **ACI** ආයතනය සැලසුම් කර ඇත.(සාමාන්‍යයෙන් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවේ)





| | |
|---|---|
| **කවුරුන් සඳහා ද** | මෙරට ජීවත්වන ඉතාලි රියදුරු බලපත් ලාභී ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් |
| **අරමුණ** | ආරක්ෂාකාරී රිය ධාවනය පිළිබඳ මූලික සිද්ධාන්ත සමග න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමත්, හිම, වැසි සහ කුණාටු ආදි හදිසි අවස්ථාවන් වලදී කටයුතු කරන ආකාරය පිළිබඳ දැනුමක් ලබා දීම. |
| **පවත්වන දිනය** | තෝරාගත් සතිඅන්ත වලදී |
| **පාඨමාලා කාලය** | එක් දින පාඨමාලාවකි (සෙනසුරාද/ඉරිද) |
| **ස්ථානය** | රෝමයේ දි - Autodromo di Vallelunga, Via Mola Maggiorana, 4/6 - 00063 Campagnano di Roma, Province of Rome – මෙම පාඨමාලාව **ACI's** (ඉතාලි මෝටර් රථ සම්මේලනයේ) විශේෂඥයෙකු විසින් පවත්වනු ලැබේ. |
| **පාඨමාලා ගාස්තු** | ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් **නොමිලේ පැවැත්වේ** (පුද්ගලිකව මෙම පාඨමාලාව හැදෑරීම සඳහා එක් අයෙකුට යුරෝ 400.00 ක පමණ පිරිවැයක් දැරීමට සිදුවේ.) |
| **පාඨමාලා මාධ්‍ය** | ඉතාලි |
| **ප්‍රවාහන පහසුකම්** | රෝමයේ ටර්මිනි දුම්රිය ස්ථානයේ සිට පාඨමාලාව පැවැත්වෙන ස්ථානයට යාමට හා පාඨමාලාව අවසානයේ නැවත ටර්මිනි දුම්රිය ස්ථානයට පැමිණීමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් **ACI** (Automobile Club d'Italia) මඟින් සපයනු ලැබේ. |
| **ලියාපදිංචිය** | අන්තර්ජාලය මගින් සිදුකෙරේ.<br>පහතින් ලිපිනය දක්වා ඇති වෙබ් අඩවියට පිවිස ඔබගේ වාසගම, නම, උපන්දිනය, විද්‍යුත් ලිපිනය(Email), ජාතිකත්වය, රියදුරු බලපත් වර්ගය, පාඨමාලා දිනය, රියදුරු බලපත් අංකය හා ඔබගේ දුරකථන අංකය (මෙම තොරතුරු අනිවාර්යයෙන් ලබාදිය යුතු බව සලකන්න) ඇතුලත්කර ලියාපදිංචිය සිදු කල යුතු අතර, පාඨමාලාව සඳහා තෝරාගන්නා අයට ඔවුන්ගේ පාඨමාලා දිනය දැනුම් දෙනු ඇත. |

නොපමාව අදම අයදුම් කරන්න.

www.vallelunga.it/it/3000-automobilisti-stranieri-ambasciatori-di-sicurezza-stradale

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
රෝමය
2012 සැප්තැම්බර් මස 18